# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
## அரச நிதித் திணைக்களம்
## DEPARTMENT OF PUBLIC FINANCE

මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ-01, ශ්‍රී ලංකාව.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு-01, இலங்கை.
General Treasury, Ministry of Finance, Colombo-01, Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2436337

කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

Website: www.pfd.gov.lk
E-mail: pubfin@pfd.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/PMD/Cir.Letter/2013

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2013.10.17

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපි අංක: 02**

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) විසින් නිකුත් කරන ලද ලංසු සුරක්ෂණ හා ඇප**

රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 හි 5.3.11 ඡේදයෙහි දක්වා තිබෙන උපදෙස් නොතකා ඇතැම් ප්‍රසම්පාදන අස්ථිත්වයන් විසින් ඉදිකිරීම් වැඩ ප්‍රසම්පාදනවලදී ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) විසින් නිකුත් කරන ලංසු සුරක්ෂණ හා ඇප පිළිනොගැනීම පිළිබඳව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි ලැබී තිබේ.

ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල පිහිටුවීමේ අරමුණ වී ඇත්තේ වාණිජ බැංකු සහ අනෙකුත් පිළිගත් ආයතනවලින් දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ලංසු සුරක්ෂණ හා ඇප ලබාගැනීම අපහසුවන අවස්ථාවලදී ඒ සඳහා ඔවුනට පහසුකම් සැලැස්වීම වන අතර, ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල විසින් නිකුත් කරනු ලබන ලංසු සුරක්ෂණ හා ඇප නොපිළිගැනීමෙන් කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් ප්‍රසම්පාදනය සඳහා සහභාගී වීම වළක්වාලන අතර, එමගින් දේශීය කොන්ත්‍රාත්කරුවන් සහ සමස්ථයක් ලෙස ඉදිකිරීම් අංශයේ ධාරිතාව ඉහළ නැංවීම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලැබේ.

ඒ අනුව, ඉදිකිරීම් වැඩ ප්‍රසම්පාදනයන්හිදී ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) විසින් නිකුත් කරන ලංසු සුරක්ෂණ හා ඇප පිළිගත හැකි ඇප ලෙස පැහැදිලි උපදෙස් ටෙන්ඩර් ලියකියවිලිවල / යෝජනා කැඳවීම්වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවත්, මූල්‍යනය කරන මූලාශ්‍රය නොසලකා කොන්ත්‍රාත් ඇගයීමේ දී හා ප්‍රදානය කිරීමේ දී මෙම උපදෙස් අනුගමනය කිරීමට ඔබ යටතේ ක්‍රියාත්මක වන සියලු ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටුවලට උපදෙස් ලබා දීමට කටයුතු කළ යුතු බවත් කාරුණිකව දන්වා සිටිමි.

පී. අල්ගම
අධ්‍යක්ෂ ජනරාල්